**ශීර්ෂය 311 -ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන **වාර්තාව** 2021 ජුලි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපව ඉදිරිපත් කර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 **මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම**

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්,එම අවශ්‍යතාවයෙන් බැහැර වූ අවස්ථාවක් විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී තැන්පතු ලැබීම් රු.3,663,806 ක් හා තැන්පත් ගෙවීම් 1,291,958 ක් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය යටතේ ගැලපීම් සිදුකළ යුතු වුවද මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය යටතේ ගලපා තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව මූල්‍ය ක්‍රියාකාරකම් සිදු නොකරන ආයතනයක් බැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි මෙම මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවහය යටතේ ගලපා ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) පුනරාවර්ථන වියදම්**<br><br>මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. එසේ වුවද වැය විෂයයන් 04 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු. 41,635,000 න් එකතුව රු. 4,224,600 ක් හෙවත් | නිලධාරීන්/ සේවකයන් විශ්‍රාම යාම, අපේක්ෂිත පරිදි බඳවා ගැනීම් සිදු නොවීම, COVID – 19 වසංගත තත්වය නිසා රාජකාරී ගමන් අඩුවීම හේතුවෙන් වාහන නඩත්තු වියදම් හා සංචාරක බංගලා හා විශ්‍රාම ශාලා වසා තැබීම නිසා විදුලිය හා ජලය සඳහා වන වියදම් අඩු වීම | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතුය. |

| | | |
|---|---|---|
| සියයට 10.15 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. | හේතුවෙන් අදාල වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතුණි. මෙම ඉතිරිය ප්‍රතිපාදන නොලැබුණු නමුත් අත්‍යාවශ්‍යයෙන්ම දැරිය යුතු වියදම් සඳහා අදාල වැය විෂයන්ට මාරුකර ගැනීමට කටයුතු කරන ලදී.<br><br>රටේ ඇතිවූ කොරෝනා වසංගත තත්ත්වය මත ජාතික භෞතික සැලසුම් සකස් කිරීමට අදාළ කටයුතු කළ නොහැකි වීම නිසා 2506 යටතේ ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු වූ අතර, එම ප්‍රතිපාදනය ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරයේ අත්‍යවශ්‍ය නවීකරණ කටයුත්තක් වෙනුවෙන් මාරුකරන ලදී. | |

**(ආ) මූලධන වියදම්**

| | | |
|---|---|---|
| අවශ්‍යතා අනුව වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු වුවද ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂය සඳහා රු. 650,000 ක්ව තිබූ වාර්ෂික අයවැයගත ප්‍රතිපාදනය ඉක්මවා රු. 2,515,200 ක් හෙවත් සියයට 287 ප්‍රතිපාදන මු.රෙ. 66 මාරු කිරීම් මගින් වෙන්කර ගෙන තිබුණි. | ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්ම සංකල්පයට හා නව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලවන පරිදි ජාතික භෞතික සැලැස්ම යාවත්කාලීන කිරීමට සිදු වූ අතර, එකී කටයුතු සඳහා විවිධ පාර්ශවයන් සමඟ සාකච්ඡා හා වැඩමුළු ආදිය පැවැත්විය යුතු වන බැවින් ඒ සඳහා ප්‍රමාණවත් හා සුදුසු වන පරිදි ශ්‍රවණාගාරය නවීකරණය කර ගැනීම අත්‍යාවශ්‍ය වූ කරුණක් බැවින්, එම නවීකරණ කටයුතු වෙනුවෙන් මෙසේ ප්‍රතිපාදන මාරු කරන ලදී. | ඇස්තමේන්තු මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ වලින් ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලද ප්‍රතිපාදන වලින් රු. 2,135,588 ක් ඉතිරිව තිබුණි. ඉන් කතරගම පූජාභූමි සංවර්ධනය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයෙන් ලද රු. 2,431,056 න් රු. 2,050,294 ක් ඉතිරිව තිබුණු අතර එම ඉතිරිවීම් සියයට 85 ක් බව නිරීක්ෂණය විය. | කතරගම පහසුකම් ගොඩනැගිලි සඳහා භූ දර්ශන කටයුතු කිරීමට කතරගම දේවාලයෙන් යෝජනා කර තිබූ බැවින්, ඒ සඳහා අමතර මුදල් ප්‍රතිපාදන ඉල්ලුම් කළද රටේ පැවති කොරෝනා වසංගත තත්වය සහ ව්‍යාපෘතිය නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ හෙයින් එම භූ දර්ශන කටයුතු කිරීම අත්හිටුවන ලදී. | භාර ගත් ව්‍යාපෘති අදාල කාලය තුල සම්පූර්ණ කළ යුතුය. |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, | පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සඵලතාවය පිළිබඳ නිරතුරුවම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී සාකච්ඡා කර අවශ්‍ය වෙනස්කම් කරනු ලබන බවත් ඉදිරියේදී මේවා සම්බන්ධයෙන් ලිඛිතව විගණකාධිපති වෙත වාර්තා කිරීමට කටයුතු කරන බවත් දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ලිඛිත ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවීම් හිඟ හිටව තිබූ අත්තිකාරම් ශේෂවල මුළු එකතුව රු.386,015 ක් වූ අතර වසර 1 ට වැඩි රු.356,015 ක් හා වසර 5 ට වැඩි රු. 30,000 ක් විය. | වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 183,840.00 ක මුදල අදාල විනය කටයුතු අවසන්ව නොමැති බැවින් අයකර ගැනීමට නොහැකි වී ඇත. සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් වසර විස්සට වැඩි රු.30,000 ක මුදල කපාහැරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර ඉතිරි රු.172,175.00 ක මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ණය ශේෂයන් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ | 2019 වර්ෂයට සාපේක්ෂව ඉන්ධන දහනය පරීක්ෂාව අවම වී ඇත. ඉදිරියේදී අංක 30/2016 හා 2016 | වත්කම් නිසි පරිදි කළමනාකරණය කළයුතුය. |

| | | |
|---|---|---|
| එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද දෙපාර්තමේන්තුව සතු වාහන 14 ක් සම්බන්ධයෙන් 2019 මැයි 01 දිනෙන් පසු ඉන්ධන දහන් පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. තවද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීමේ කමිටු වාර්තා සම්බන්ධයෙන්ද විගණනයේදී සැහීමට පත්විය නොහැකි විය. | දෙසැම්බර්29 දිනැති රා.ප.චක්‍රලේඛයේ 3.1 විධිවිධාන වලට අවධානය යොමු කර කටයුතු කිරීමට සටහන් කරගතිමි. | |
| (ආ) 2017 වර්ෂයේ මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත තාවකාලිකව ලබාදී තිබුණු කැබ් රථයක් 2020 ඔක්තෝබර් මස වනතෙක් දෙපාර්තමේන්තුව වෙත බාරදී නොතිබුණි. එසේ දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් වසර 04 කට වඩා වැඩි කාලයක් වෙනත් ස්ථානයක තිබියදී රු. 79,697 ක මුදලක් ගෙවා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රක්ෂණය කර තිබුණි. තවද, 2020 ඔක්තෝබර් මස කැබ් රථය නැවත දෙපාර්තමේන්තුව වෙත බාර දෙනවිට අළුත්වැඩියා කටයුතු සිදුකළ යුතු තත්ත්වයේ පැවතුණි. | තාවකාලිකව අමාත්‍යාංශය වෙත නිදහස් කර ඇතත් අංක CAP – 8036 දරණ මෝටර් රථය මෙම දෙපාර්තමේන්තුවේ සංචිතයට අයත් වාහනයක් බැවින් රක්ෂණ කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදුකර ඇත. වාහනය මෙම දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදෙන ලෙස 2018 සැප්තැම්බර් 26 දිනැතිව ලිඛිතව ඉල්ලීමක් සිදුකළද නැවත භාරදීමට කටයුතු කර ඇත්තේ 2020 ඔක්තෝබර් 26 දින වේ. නමුත් එය භාර දෙන අවස්ථාවේදී අළුත්වැඩියා තත්වයෙන්ම වාහනය භාර දී ඇත. | වත්කම් නිසි පරිදි කළමනාකරණය කළයුතුය. |

**04.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 283 ක්ද වූ අතර | බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට සිදුවීම, | පුරප්පාඩු නිසි ලෙස පිරවීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | තථ්‍ය සේවක සංඛ්‍යාව 163 ක්ද පුරප්පාඩු 120 ක් ද විය. එනම් විධායක ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 51 ක් වූ අතර එයින් තනතුරු 39 ක් පුරප්පාඩුව පැවතුණි. මෙය සියයට 77 ක ප්‍රතිශතයක් විය. මීට අමතරව තෘතීයික තනතුරු සංඛ්‍යාවෙන් සියයට 38 ක්ද ද්විතියික හා ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු පිළිවෙලින් සියයට 48 ක් හා සියයට 22 ක් ලෙස පුරප්පාඩුව පැවතුණි. මේ අනුව අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩුව පවතින මුළු තනතුරු සංඛ්‍යාව සියයට 42 ක් විය.මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීමට නොහැකිවීමේ අවධානමක් පවතින බවද නිරීක්ෂණය විය. | වත්මන් කොවිඩ් වසංගත තත්ත්වය තුල විවෘත තරඟ විභාග පැවැත්වීමට නොහැකිවීම, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 අනුව ප්‍රාථමික සේවා ගණයේ බඳවා ගැනීම් අත්හිටුවා තිබීම, සුදුසුකම් පසුරා ඇති නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ නොමැතිවීම, යන හේතු මත පුරප්පාඩු පැවති අතර අනෙතුක් පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත හා පළාත් සභා හා රාජ්‍ය සේවා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | කළ යුතුය. |
| (ආ) | අධ්‍යක්ෂ (පාලන) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ යන තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකු සියළු දීමනා සහිතව පිළිවෙලින් මාසිකව රු. 189,350 ක් හා රු. 71,745 ක් බැගින් ගෙවීමට යටත්ව බඳවා ගෙන තිබුණි. | විධායක තනතුරු වල පුරප්පාඩු ඇති බැවින් සිදුකරන කාර්යයන් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා මෙම නිලධාරීන් පත්කර ඇත.<br>එසේම පුරප්පාඩුවූ අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුර සඳහා පත්කිරීමට සුදුසු නිලධාරියෙකු දෙපාර්තමේන්තුව තුල නොසිටීම නිසා විශ්‍රාමලත් නිලධාරියෙකු නැවත සේවයේ යොදවා ඇත.<br>අදාල තනතුරු දෙකෙහි දීමනා ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 හි විධිවිධාන පරිදි සිදුකර ඇත. | පුරප්පාඩු නිසි ලෙස පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 10 දෙනෙකු, විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් රහිතව වෙනත් රාජ්‍ය ආයතන සඳහා මුදාහැර තිබුණි. | ව්‍යාපෘති සඳහා නිළධාරීන් මුදා හැරීමේදී දෙපාර්තමේන්තු ගත තනතුරු දරන නිලධාරීන් අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතියෙන් මුදා හැර ඇතත්, කාලසීමාව වසර 02 ඉක්මවා යාමේදී රාජ්‍ය සේවා කොමිෂන් | දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීමට මානව සම්පත ප්‍රමාණවත් නොවීමේ ගැටළු ඇති නොවන ආකාරයෙන් සහ |

| | |
|---|---|
| සභාවේ අනුමැතිය / ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමුකර ඇත. තවද ඒකාබද්ධ සේවාවේ පත්වීම් දරණ එනම් සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් මුදාහැරීමේදී ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. තවද රජයේ අවශ්‍යතාවය මත මුදාහැරීමේදී අදාල අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය 11 පරිශිෂ්ටය මගින් ලබා දී ඇත. | විධිමත් අනුමැතීන් ලබාගෙන කටයුතු කළ යුතුය. |

.